# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO — 1608/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 21/10 /2024 පැය 1440

## මාධ්‍ය නිවේදනය

**බීමත් පුද්ගලයින් පරීක්ෂා කිරීම සඳහා ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) මිලදී ගැනීමක් සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකා පොලිසිය වෙත බීමත් රියදුරන් පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමිතියෙන් තොර ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) මිලදී ගෙන ඇති බවට මාධ්‍ය හා සමාජ මාධ්‍ය ජාල හරහා සංසරණය වූ පුවතක් සම්බන්ධයෙන් සිදු කරනු ලබන පැහැදිලි කිරීම.

ඒ අනුව, මේ සම්බන්ධයෙන් පොලිස් සැපයුම් කොට්ඨාසයේ අධ්‍යක්ෂ විසින් මා වෙත ලිපියක් යොමු කරමින් දන්වා ඇත්තේ ශ්‍රී ලංකා පොලිසිය වෙත බීමත් රියදුරන් පරීක්ෂා කිරීම සඳහා වූ ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) 15,000 ක් ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මිලදී ගැනීමට කටයුතු සිදු කර ඇති අතර ඒ සම්බන්ධව ටෙන්ඩර් ක්‍රියාවලිය මඟින් ලංසු කැඳවා ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) සැපයීමට පුද්ගලික ආයතනයක් වෙත ඇණවුම් ලබා දී තිබූ බවයි.

ඒ අනුව අදාළ පුද්ගලික ආයතනය විසින් ප්‍රංශයෙන් ආනයනය කල එහි පළමු තොගය ලෙස නළ 10 බැගින් අඩංගු පෙට්ටි 197 ක් පොලිස් සැපයුම් කොට්ඨාසය වෙත ලබා දී ඇත. එම තොගයට අදාල නිදර්ශක රජයේ රස පරීක්ෂක වෙත යොමු කිරීමෙන් අනතුරුව එහි ගුණාත්මකභාවය හොඳ බවට කල නිර්දේශයෙන් පසු එම තොගය රථවාහන මූලස්ථානය වෙත නිකුත් කිරීමට කටයුතු කර ඇත.

එහි දෙවන තොගය ලෙස ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) 10 බැගින් අඩංගු පෙට්ටි 14,803 ක් සැපයුම් කර ඇති අතර එහි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා නිදර්ශක රජයේ රස පරීක්ෂක වෙත යොමු කර ඇති අතර එහි පරීක්ෂක වාර්තාව පදනම් කර ගුණාත්මක කමිටුව විසින් එම ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) භාවිතයට නුසුදුසු බවට නිර්දේශ කර ඇත.

ඒ අනුව නැවත අදාල සැපයුම් ආයතනය දැනුවත් කිරීමෙන් පසු ඔවුන් විසින් සැපයුම් කරන ලද ශ්වසන පරික්ෂණ නළ (Breathalyzer) තොගයෙන් නැවත ආදර්ශයන් ලබාගෙන ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත යොමු කරන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ගුණාත්මක කමිටුව විසින් නැවත ආදර්ශ ලබාගෙන රජයේ රස පරීක්ෂක

කාර්යාල වෙත යොමු කර ඇති අතර පෙර පරිදිම ගුණාත්මක කමිටුව එම නළ තොගයට ගැනීම නිර්දේශ කර නොමැත.

එම හේතුවෙන් රජයේ රස පරීක්ෂක නිලධාරින් සමඟ සාකච්ඡා කර අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා අදාල ආයතනය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

මෙම ශ්වසන පරික්ෂණ නළ තොගයට අදාල **පළමු නළ 1970 සඳහා ගෙවීම් කටයුතු සිදු කර ඇති අතර දෙවනවර සපයන ලද තොගයට මෙතෙක් ගෙවීම් කිරීමක් හෝ තොග වශයෙන් ගණන් ගැනීමක් හෝ භාවිතා කිරීම සඳහා නිකුත් කිරීමක් සිදු කර නොමැති බව සඳහන් කරමින්** අධ්‍යක්ෂ සැපයුම් මා වෙත වැඩිදුරටත් වාර්තා කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**